## 55 – අලුත්ම ගීයෙන්

අල්ලෙලූයා අල්ලෙලූයා
අල්ලෙලූයා

අලුත්ම ගීයෙන් සමිඳුන් ගයමු
අපි සැම සතුටින් එතුමන් වනමු
මනු සැම අදරින් මැව් දෙවිඳුන් හට
ගයනෙමු තුති ගීතා

තුති වේවා සැරදේවා මංගල වේවා
ඔබ හට අද දින තුති මංගල ගී
ගයන්නේ ඔබ දරුවෝ //

හෙළ බිම ලස්සන ඔප ගන්වාලා
හෙළ බිම අපහට මව් බිම කරලා
හෙළ බිම සිරිගන්වන දෙව් සමිඳුට
ගයනෙමු තුති ගීතා

කරදර කළහල මැද සොහොවුරු සේ
ආදර පෙම් කළ කිතු සමිඳුන් සේ
සමූහ ජීවය ගෙනදුන් සුරිඳුට
ගයනෙමු තුති ගීතා